41

Human Rights Commission of Sri Lanka
Library
No. 165, Kynsey Road,
Colombo 08.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2016. 2016.12.07 |

පැමිණිලිකරු : ඕ.එන්.සි. සිල්වා මිය
එෆ් 51, ශාන්ත අන්තෝනි මාවත,
කොළඹ 03.

වගඋත්තරකරු : විදුහල්පති,
විශාඛා විද්‍යාලය
කොළඹ 05.

**පැමිණිලි අංකය : HRC/3469/15/L - 14**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ 2016 පළමු ශ්‍රේණිය සඳහා තම දරුවා වන ශෙරෝන් නටාෂා නිකලස් යන අය වගඋත්තරකාර විද්‍යාලයට ඇතුලත් කර ගැනීමේ අරමුණින් ආසන්න පදනම මත අයදුම්පතක් යොමු කරන ලද බවයි.

තවද තමාගේ අයදුම්පත්‍රය සීසී 279 යන අනු අංකය යටතේ ඉහත කී වගඋත්තරකාර විශාඛා විද්‍යාලය විසින් ලියාපදිංචි කර ඇති බවත් තමා හට සියළු සුදුසුකම් තිබියදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තමාගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කර ඇති බවත්ය.

මෙම පැමිණිලිකාරිය තමාගේ පැමිණිල්ල සමග සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිත් කරන ලද සියළුම ලේඛන වල ඡායා පිටත් මෙම පැමිණිල්ල සමග අමුණා එවා ඇත. එනම් පදිංචිය සනාථ කිරීම සඳහා ,

- සාමදාන විනිශ්චයකාර වාරයා විසින් තහවුරු කල දිවුරුම් ප්‍රකාශයේ පිටපතක්
- තමාගේ ස්වාමිපුරුෂයාගේ මවගේ නමට තිබූ ඔප්පුවේ පිටපතක්
- තමාගේ සහ තම ස්වාමිපුරුෂයාගේ නම ඇතුලත් ඡන්ද හිමි නාමලේඛනයේ පිටපතක්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165,කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் / Secretary: 011-2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2689558, 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

- ස්වාමිපුරුෂයාගේ උප්පැන්න සහතිකයේ පිටපතක්
- දියණියගේ උප්පැන්න සහතිකයේ පිටපතක්
- පැමිණිලිකාරියගේ සහ ස්වාමිපුරුෂයාගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක්
- පදිංචිය සනාථ කිරීම සඳහා වූ අනෙකුත් ලේඛනව වල පිටපත් සහ යන ආදිය ඉදිරිපත් කරයි.

**වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-**

වගඋත්තරකාර විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2016.02.08 දිනැති වාර්තාවක් මගින් හා 2016.02.09 වන දින පවත්වන ලද පරීක්ෂණයේදී වාචිකව කරුණු ඉදිරිපත් කරමින් දක්වා ඇත්තේ 23/2013 අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්ගේ චක්‍රලේඛනයට අනුව පදිංචි ස්ථානයේ හිමිකම සනාථ කිරීමේදී ඉල්ලුම්කාරියගේ මවගේ හෝ පියාගේ නමට හිමිකම් ඔප්පුවක් තිබේනම් පමණක් උපරිම ලකුණු 10ක් ලබා දෙන බවත්. නමුත් මෙම අයදුම්කාරිය විසින් පදිංචිය තහවුරු කරන ලේඛන ලෙස ඉදිරිපත් කර ඇති හිමිකම් ඔප්පුවේ හිමිකම ඇත්තේ අයදුම්කාරියගේ ස්වාමිපුරුෂයාගේ මවගේ නමට බවත් එහෙත් එම ඥාතිත්වය තහවුරු කිරීම සඳහා කිසිදු ලේඛනයක් ඉදිරිපත් කර නොතිබුණු බවත් ය.

වගඋත්තරකරු තවදුරටත් සඳහන් කර ඇත්තේ පදිංචිය තහවුරු කිරීම සඳහා පැමිණිලිකාරිය අපොහොසත් වූ බැවින් හිමිකම් ඔප්පුව සඳහා ලකුණු ලබා නොදුන් බවත් එම හේතුව මත ඉන් අනතුරුව කිසිදු අතිරේක ලේඛනවලට ලකුණු ලබා දීමක් සිදු නොකරන ලද බවයි. තවද මෙම අයදුම්කාරියට හිමිවූ ලකුණු ප්‍රමාණය වූයේ ලකුණු 33ක් බවත්. ප්‍රථම සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ අවම ලකුණු සීමාව ලකුණු 50ක් බවත් ඒ අනුව මෙම පැමිණිලිකාරියට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් කිසිදු අසාධාරණයක් සිදු නොවූ බව සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :-**

මෙම පැමිණිල්ල සම්බන්ධව පරීක්ෂයේදී හෙළි වූ කරුණු අනුව පැමිණිලිකාරිය දන්වා ඇත්තේ තමාහට තමාගේ දියණිය වන ශෙරෝන් තටාෂා නිකලස් යන අයව වගඋත්තරකාර විශාඛා විද්‍යාලයට ඇතුලත් වීම සඳහා සියළුම සුදුසුකම් ඇති බවයි.

එම සුදුසුකම් තහවුරු කිරීම සඳහා පැමිණිලිකාරිය විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ ලේඛන වල පිටපත් මෙම පැමිණිල්ලට අමුණා ඇත.

වගඋත්තරකරු පවසන පරිදි පැමිණිලිකාරියගේ ස්වාමිපුරුෂයාගේ මවගේ නමට තිබෙන හිමිකම් ඔප්පුවේ ඥාතිත්වය තහවුරු කිරීම සඳහා කිසිදු ලේඛනයක් ඉදිරිපත් කර නොමැති බව දන්වා ඇත.

පැමිණිලිකාරිය පවසන්නේ තමා වගඋත්තරකාර පාසලට අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අයදුම්පත්‍ර සහ ලිපි ලේඛන පරීක්ෂා කර බලා එම ලේඛන විධිමත්ව සකස්කර දිවුරුම් ප්‍රකාශයක් සමග ඉදිරිපත් කර ඇති බවයි.

පැමිණිලිකාරිය කොමිෂන් සභාවට ඉදිරිපත් කළ ලේඛන පරීක්ෂා කිරීමේදී ඇය විසින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේ පිටපතද් අමුණා ඇත. එහිදී තමාගේ ස්වාමිපුරුෂයාගේ මවගේ නමට තිබූ හිමිකම් ඔප්පුවේ ඥාතිත්වය තහවුරු කිරීම සඳහා තමාගේ ස්වාමිපුරුෂයාගේ උප්පැන්න සහතිකය ද එම දිවුරුම් ප්‍රකාශයේ ජේද අංක 04 ආ යටතේ සඳහන්ව ඇති බව නිරීක්ෂණය වේ.

තවද පාසලෙන් ඉදිරිත් කරන ලද ලකුණු ලබා දීමේ ලේඛනයට අනුව ඡන්ද හිමි නාමලේඛනයේ මව සහා පියා දෙදෙනාම ලියාපදිංචි වී සිටීමට ලකුණු 33ක් ලබාදී ඇති බව නිරීක්ෂණය වේ.

චක්‍රලේඛනය ප්‍රකාරව ලකුණු ලබා දීමක් සිදුවූයේ නම් පදිංචිය තහවුරු කරන හිමිකම් ලේඛනයට ලකුණු 06ක් ලබා දිය යුතුය. එනම් හිමිකම් ඔප්පුව ඉල්ලුම්කාරියගේ ස්වාමිපුරුෂයාගේ මවට තිබෙන නිසාය. පදිංචිය සනාථ කරන අතිරේක ලේඛන සඳහා ජාතික හැදුනුම්පත දියණියගේ උප්පැන්න සහතිකය සමග තවත් ලේඛන ඉදිරිපත් කර ඇති බැවින් එම ලේඛන සඳහා තවත් ලකුණු 02ක් ලැබිය යුතු බව නිරීක්ෂණය වේ. පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව පදිංචිය සනාථ වන්නේ නම් පාසල් 03කට ලකුණු අඩුවී ලකුණු 35ක් ලබා දී ඇති ඇත. ඒ අනුව පැමිණිලිකාරියට ලැබිය යුතු මුළු ලකුණු සංඛ්‍යාව 76 ක් විය යුතු බව නිරීක්ෂණය වේ.

2016 වර්ෂයේ පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන් ඇතුලත් කිරීමේ අවම ලකුණු ප්‍රමාණය වන්නේ ලකුණු 62ක් වේ. 23/2013 චක්‍රලේඛනය ප්‍රකාරව මෙම පැමිණිලිකාරියට ලකුණු ලබා දීමක් සිදුකර ඇත්නම් මෙම අවම ලකුණු ප්‍රමාණය අභිබවා ලකුණු ලබා ගැනීමේ හැකියාවක් පැමිණිලිකාරියට ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරු පවසන පරිදි පැමිණිලිකාරියගේ ස්වාමිපුරුෂයාගේ මවගේ නමට ඇති හිමිකම් ඔප්පුව පැමිණිලිකාරියගේ ස්වාමිපුරුෂයාගේ මව ලෙස තහවුරු කිරීම සඳහා වන ස්වාමිපුරුෂයාගේ උප්පැන්න සහතිකය ලබාදී නොමැති නම් වගඋත්තරකරු එය පැමිණිලිකාරියගේ දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති බව පෙනී යන හෙයින් එම දිවුරුම් ප්‍රකාශය සමග පැමිණිලිකාරිය ඉදිරිපත් කර ඇති ලේඛන ගලපා එහිදී යම් ගැටළුවක් මතුවූයේ නම් ඒ සඳහා කරුණු ඉදිරිපත් කිරීමට පැමිණිලිකාරියට අවස්ථාවක් ලබාදිය යුතුව තිබිණ.

නමුත් මෙම පැමිණිලිකාරියට වගඋත්තරකරු එම අවස්ථාව ලබා දී නැත. එබැවින් මෙම පැමිණිල්ල පරීක්ෂණයට ගත් අවස්ථාවේ හෙලිවූ කරුණු අනුව කොමිෂන් සභාවට පෙනී යන්නේ පැමිණිලිකාරිය තමාගේ දියණිය මෙම පාසලට ඇතුලත් කිරීම සඳහා වූ අයදුම්පත්‍ර ඉදිරිපත්

කිරීමේදී 23/2013 චක්‍රලේඛය ප්‍රකාරව අවශ්‍ය ලේඛන ඉදිරිපත් කර ඇති බවත්, එම ලේඛන පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශ සමග ගලපා පරීක්ෂා කිරීමට වගඋත්තරකාර පාසල අපොහොසත් වී ඇති බවයි.

**නිගමනය :**

ඉහත කී කරුණු සලකා බැලීමේදී 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව මගින් සහතික කොට ආරක්ෂා කර දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙම පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

මෙම පැමිණිලිකාරියගේ දරුවා වන ශෙරෝන් නටාෂා නිකලස් දියණියව 2016 වර්ෂයේ විශාඛා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමට කටයුතු කළයුතුය.

2016.12.27 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු බලන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
**Human Rights Commission of Sri Lanka**
**No. 165, Kynsey Road,**
**Colombo 08.**

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
**Human Rights Commission of Sri Lanka**
**No. 165, Kynsey Road,**
**Colombo 08.**

පිටපත : අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.